# ප්‍රාණපරිත්‍යාගී නිදොස් බිළිඳුන්ගේ

**මංගල්‍යය**

## පළමුවන දේව ප්‍රකාශනය 1 ජොහන් 1:5 – 2:2

*ශුද්ධ වූ ජොහන් තුමන් විසින් ලියන ලද පළමුවන හසුනෙන් උපුටා ගත් කොටසකි.*

ජේසුස් වහන්සේගේ ලේ සියලු පව්වලින් අප පවිත්‍ර කරන්නේ ය.

උන් වහන්සේගෙන් අප ඇසූ, ඔබට දන්වන පණිවුඩය මෙය වේ: දෙවියන් වහන්සේ ආලෝකය ය, උන් වහන්සේ තුළ කිසි ම අන්ධකාරයක් නැත. එබැවින්, උන් වහන්සේ සමඟ අපි සහභාගිකම පවත්වන්නෙමු යි කියමින් අපි අන්ධකාරයෙහි හැසිරෙමු නම් අප කියන්නේ බොරුවකි. අප පිළිපදින්නේ සත්‍යය නොවේ. එහෙත් උන් වහන්සේ ආලෝකයෙහි සිටින සේ ම අපිත් ආලෝකයෙහි හැසිරෙමු නම්, එකිනෙකා සමඟ සහභාගිකම අපට ඇත. එවිට උන් වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසුස් වහන්සේගේ ලේ සියලු පව්වලින් අප පවිත්‍ර කරන්නේ ය. අපට පාපයක් නැතැ යි කියමු නම්, අපි අප ම රවටාගනිමු. සත්‍යය ද අප තුළ නැත. එහෙත් අපි පාපෝච්චාරණය කරමු නම්, විශ්වාසවන්ත වූ ද, ධර්මිෂ්ඨ වූ ද, දෙවියන් වහන්සේ සියලු පාප වලින් ද අදමිටුකම්වලින් ද අප පවිත්‍ර කරන සේක. අපි පව් කර නැතැයි කියමු නම්, අපි උන් වහන්සේ බොරු කාරයෙකු කරමු. උන් වහන්සේගේ වචනය ද අප තුළ නොපවතියි.

මාගේ ප්‍රිය දරුවෙනි, මේ කාරණා මා ඔබට ලියා එවන්නේ ඔබ පව් නොකරණ පිණිස ය. එහෙත් යමෙකු පව් කළොත්, ධර්මිෂ්ඨ වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ නම් මැදහත්කාරයාණන් කෙනෙක් අප වෙනුවෙන් පියාණන් වහන්සේ වෙත සිටින සේක. අපේ පාපයෙන් මිදීමේ බලය උන් වහන්සේ ය: එය අපේ පව් උදෙසා පමණක් නොව සකල ලෝකයාගේ ද පව් උදෙසා ය.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 124: 2–8

පිළිතුර : අපේ සතුරාගෙන් අප මිදූ සමිඳාණන්ට ප්‍රශංසා වේවා!

ගීය : අපට විරුද්ධ ව සතුරන් නැගිට ආ කල,
අපේ පැත්තට සමිඳාණෝ නොසිටි සේක් නම්,
ඔවුන්ගේ උදහස අපට විරුද්ධ ව ඇවුළුණු කල,
අප පණපිටින් ගිල ගන්න ට ඔවුන් ට ඉඩ තිබිණි.

එවිට ජලයෙන් අප වැසී යන්නට ඉඩ තිබිණි.
දිය දහරින් අප යට කොට ගසාගෙන යන්නට ඉඩ තිබිණි.
සැඩ ජල කඳ අප යට කොට ගසාගෙන යන්නට ඉඩ තිබිණි.

අපේ සතුරන්ට අප ගොදුරු වීමට ඉඩ නොදුන්
සමිඳාණන්ට ප්‍රශංසා වේ වා!
උගුල බිඳී ගියේ ය. අපි ගැළවුණෙමු.
අපේ පිහිටට ඇත්තේ, අහසත් පොළොවත්
මැවූ සමිඳුන්ගේ නාමය ය.

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
දෙවිඳුනි, අපි ඔබ පසසමු.
ඔබ අපේ සමිඳාණන් බව අපි පිළිගනිමු.
සමිඳුනි, ප්‍රාණපරිත්‍යාගිවරයන්ගේ
උදාර සේනාව ඔබ පසසන්නේ ය.
ආලේලූයා!

## සුවිශේෂය

මතෙව් 2: 13-18

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### හෙරෝද් රජ බෙත්ලෙහෙම හා ඒ අවට සියලු පිරිමි දරුවන් මරා දැමීමට අණ දුනි.

ශාස්ත්‍රවන්තයන් ගිය පසු සමිඳාණන් වහන්සේගේ දූතයෙක් සිහිනයකින් ජෝසෙප්ට දර්ශනය වී, ඔහු අමතා, “නැඟිට ළදරුවා ද උන් වහන්සේගේ මෑණියන් ද රැගෙන මිසරයට ගොස් මා දන්වන තුරු එහි නවතින්න. මන්ද, හෙරෝද් රජ ළදරුවා මරාදැමීමට සොයති”යි කී ය. ඔහු රාත්‍රියෙහි නැඟිට ළදරුවාද උන් වහන්සේගේ මෑණියන් ද රැගෙන මිසරයට ගොස් හෙරෝද්ගේ මරණය දක්වා එහි සිටියේ ය. මෙසේ වූයේ, “මිසරයෙන් මාගේ පුත්‍රයා කැඳවා ගතිමි”යි කියා සමිඳාණන් වහන්සේ විසින් දිවැසිවරයා කරණකොටගෙන කියන ලද කීම ඉටුවන පිණිසය. එකල හෙරෝද් තෙමේ ශාස්ත්‍රවන්තයන් විසින් තමා රවටනු ලැබූ බව දැක, අතිශයින් උදහස් විය. එවිට ඔහු ශාස්ත්‍රවන්තයන්ගෙන් විමසා, හරියාකාර දැනගත් කාලය අනුව, දැවුරුදු වයස් වූ ද, ඊට බාල වූ ද, බෙත්ලෙහෙම හා ඒ අවට මුළු පෙදෙසෙහි සිටි සියලු පිරිමි දරුවන් මරාදැමීමට අණ කෙළේ ය. එකල දිවැසිවර ජෙරමියා විසින් කියන ලද මේ කීම ඉටු විය: “හැඬීමේ ද දැඩි වැලපීමේ ද හඬක් රාමාහි ඇසිණි. රාකෙල් ඇගේ දරුවන් ගැන අඬමින්, ඔවුන් නැති නිසා අස්වැසිල්ලක් ලැබීමට අකමැති වූ වා ය.”

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*